දුරකථන /தொலைபேசி இல. / Telephone Nos.:

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832 Fax: 2784825

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141– 50 Fax: 2784846

ඊමේල් /ஈ-மெயில்/E - mail: isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாய"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. } ED 1/21/1/2/39

දිනය / திகதி / Date } 2010.06.30

සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්.

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්.

ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්

විභාග කොමසාරිස් ජනරාල්

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්

සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්.

සියලු ම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්

සියලු ම ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්

සියලු ම පිරිවෙන් පරිවෙනාධිපති හිමිවරුන්

සියලු ම විදුහල්පතිවරුන් වෙත

චක්‍රලේඛ අංක 2010/22

## ඩෙංගු මර්ධන වැඩසටහන

ඩෙංගු මර්ධනය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2009.06.02 දිනැති 2009/17 චක්‍රලේඛය අභිබවා මෙම චක්‍රලේඛය විධිවිධාන මින් ඉදිරියට බල පැවැත් වේ.

ඩෙංගු මර්ධනය පිළිබඳව ජාතික මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක වන බැවින් එයට අනුගත ව පාසල් හා අධ්‍යාපන ආයතන ද වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ.

පාසල් හා අධ්‍යාපනික ආයතන අවට පරිසරය ඩෙංගු උවදුර සඳහා සෘජු බලපෑමක් ඇති කරයි. වර්ෂා කාලය ආරම්භයත් සමඟ ම ඩෙංගු රෝගය ව්‍යාප්ත වීමට ඇති ප්‍රවනතාව වැඩි වේ. මෙම වර්ෂයේ දී ඩෙංගු පැතිරීම විශාල වශයෙන් වර්ධනය වී තිබේ. ඩෙංගු මදුරුවා දෂ්ඨ කිරීම දිවා කාලයේ දී සිදුවන

බැවින් පාසල තුළ ගුරුවරුන් ඇතුළු ප්‍රජාව සහ සිටින සිසුන් මෙම රෝගයට ගොදුරු වීමට ඇති හැකියාව ඉහල මට්ටමක පවතී.

එහෙයින් ඩෙංගු මර්ධනය සඳහා ගත හැකි ප්‍රබල හා සාර්ථක ම ක්‍රියාමාර්ගය වනුයේ ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන නැතිකර දැමීම මගින් මදුරු ඝනත්වය පාලනය කිරීම සහ අවට පරිසරය පිරිසිදු ව පවත්වා ගැනීම ය.

අධ්‍යාපනික ආයතන හා පාසල්වල ඩෙංගු උවදුර මර්දනය සඳහා දැඩි සැලකිල්ලකින් යුතු ව ක්‍රියා කළ යුතු අතර ඒ සඳහා පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

01. ගුරු විද්‍යාල/අධ්‍යාපන විද්‍යාපීඨ/පිරිවෙන්/අධ්‍යාපන කාර්යාල/පාසල් තුළ හා අවට පරිසරය පිරිසිදු කිරීම හා නිසි ලෙස කසළ කළමනාකරණය කිරීමට කටයුතු කිරීම.

02. අදාල පරිශ්‍රයන් තුළ මදුරුවන් බෝවන ස්ථාන නොමැති බවට තහවුරු කරගැනීම.

03. ඩෙංගු රෝගය හා ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන පිළිබඳ ව පාසල් සිසුන් / ගුරු සිසුන් / ආයතනයේ සේවකයින් දැනුවත් කිරීම. මේ සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් , පළාත් පාලන ආයතනවල නිලධාරින් හෝ අදාල වෙනත් නිලධාරින්ගේ සහයෝගය ලබා ගැනීම.

04. සිසුන් මගින් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් සැලසුම් කිරීම.

05. පාසල් ප්‍රජාව හෝ අවට ප්‍රජාව හෝ වැඩසටහනට දායක කරගැනීමට කටයුතු කිරීම.

06. කසළ කළමනාකරණය සඳහා නිසි ක්‍රමවේද අනුගමනය කිරීම, ඝන අපද්‍රව්‍ය මදුරුවන් බෝ නො වන පරිදි විනාශකොට බැහැර ලීම සහ පළාත් පාලන ආයතන හා සම්බන්ධ වෙමින් අපද්‍රව්‍ය ඉවත ලීමේ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම.

ඩෙංගු රෝග මර්දන කටයුතු සාර්ථක වීමට නම් මෙම වැඩසටහන ක්‍රමවත් ව සැලසුම් කර ක්‍රියාත්මක කිරීමත් අඛණ්ඩ ව පවත්වා ගෙන යාමත් සිදු විය යුතු ය.

මේ සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ගයන් අනුගමනය කිරීම සිදුකළ යුතු වේ.

01. සෑම සතියක ම දින 02ක් (සඳුදා සහ බ්‍රහස්පතින්දා) විනාඩි 30 ක වේලාවක් ගෙන පාසල/අධ්‍යාපන විද්‍යා පීඨය/ගුරු විද්‍යාලය / පිරිවෙන/ අධ්‍යාපන ආයතනය ඇතුළත හා අවට පිරිසිදු කිරීම සහ මදුරුවන් බෝවන ස්ථාන නොමැති බවට තහවුරු කර ගැනීම.

විශේෂයෙන් ප්‍රාථමික අංශයේ සිසුන් සඳහා ඇති සෙල්ලම් මිදුලෙහි ඇති ටයර් හා වෙනත් උපකරණ , වැසිපීලි , භාවිත නො කරන ලීබඩු හා උපකරණ රැස්කරන ස්ථාන , කොන්ක්‍රීට් වහල පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය වේ.

මේ සඳහා පාසල් සම්බන්ධයෙන් නම් පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුවට වගකීම පැවරෙන අතර ඩෙංගු මර්දනය සම්බන්ධයෙන් සොයා බැලීමට පිහිටුවා ගන්නා පාසල් කමිටුව සඳහා ශිෂ්‍ය සමාජ , ශිෂ්‍ය භට කණ්ඩායම් , බාලදක්ෂ , පරිසර නියමු කණ්ඩායම්වල සිසුන්ගේ සහභාගිත්වය ලබා ගත යුතු ය.

අනෙකුත් ආයතනවල ද විශේෂ කණ්ඩායමකට වගකීම පැවරිය යුතු ය. මෙම කාර්යයේ සමස්ථ වගකීම නියෝජ්‍ය විදුහල්පතිවරයෙකුට/ එක් ගුරුවරයෙකුට/ කථිකාචාර්යවරයෙකුට/ නිලධාරියෙකුට පැවරිය යුතු ය.

02. ඩෙංගු මර්දනය පිළිබඳව සොයාබැලීම සඳහා පාසල් කමිටු පත්කර ගැනීම.

මෙහිදී පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව

1-200 දක්වා - කමිටු 1

200 - 500 දක්වා - කමිටු 2

500 - 1000 දක්වා - කමිටු 3 ක් වශයෙන් ශිෂ්‍ය සංඛ්‍යාව මත පදනම්ව කමිටු පිහිටුවා ගත යුතු ය.

මෙම කමිටු පාසල් සිසුන් , ගුරු භවතුන් හා දෙමාපියන්ගෙන් සමන්විත විය යුතු ය.

03. ක්‍රියාත්මක වැඩසැලසුම් පිළිබඳ ව අඛණ්ඩ ව නියාමනය , අධීක්ෂණය හා ඇගයීම පිළිබඳව ආයතන ප්‍රධානියා විසින් විශේෂ අවධානයක් යොමු කළයුතු අතර ඒ සඳහා ඇමුණුම 1 හි සඳහන් පරිදි පිරික්සුම් ලැයිස්තුවක් සකස්කර ඒ අනුව නියාමන වාර්තා පවත්වාගෙන යාම.

04. අවම වශයෙන් මාසයකට වරක් වත් මහජන සෞඛ්‍ය පරීක්ෂක මගින් පාසල/පිරිවෙන/ගුරු විද්‍යාලය/අධ්‍යාපන විද්‍යාපීඨය/ අධ්‍යාපන ආයතනය ඩෙංගු බෝවන ස්ථානවලින් තොර බවට නිර්දේශය ලබා ගැනීම.

05.මෙම වැඩසටහන පිළිබඳ නියාමනය ඇමුණුම 2 හි සඳහන් ආකෘතිය අනුව සිදුකළ හැකි ය. ඒ අනුව නියාමන වාර්තා පිළියෙල කර

- පාසල්/පිරිවෙන්වල නම් විදුහල්පති/පරිවේනාධිපති විසින් කොට්ඨාස අධ්‍යාපන අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද
- ගුරු විද්‍යාල අධ්‍යාපන විද්‍යාපීඨවල නම් විදුහල්පති/පීඨාධිපති විසින් ප්‍රධාන කොමසාරිස් විද්‍යාපීඨ/ගුරු විද්‍යාල වෙත ද
- කොට්ඨාස/කලාප අධ්‍යාපන කාර්යාල සම්බන්ධයෙන් කොට්ඨාස හා කලාප අධ්‍යක්ෂවරුන් විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද යොමු කිරීම.
- විභාග දෙපාර්තමේන්තුව , අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව හා ජාතික අධ්‍යාපන ආයතනය යන පරිශ්‍රයන් ඩෙංගු මදුරුවන්ගෙන් තොර ව පවත්වාගෙන යන බවට අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් වෙත සහතික කළ යුතු ය.

06. කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සෑම වර්ෂයක ම ඔක්තෝබර් 30 දිනට පෙර තම කොට්ඨාසයේ පාසල් හා පිරිවෙන් අතරින් ඩෙංගු මර්ධනය සම්බන්ධයෙන් පියවර ගන්නා හොඳ ම පාසල්/පිරිවෙන් පහත ආකාරයට තෝරා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත දැනුම් දීම.

- 1AB පාසල් 2
- 1C පාසල් 2
- 2 වර්ගයේ පාසල් 3
- 3 වර්ගයේ පාසල් 3
- පිරිවෙන් ආයතන 2

07. කලාප අධ්‍යාපන කාර්යාල මට්ටමෙන් සෑම වර්ෂයක ම නොවැම්බර් 15 දිනට පෙර තම අධ්‍යාපන කලාපයේ ඩෙංගු මදුරුවන්ගෙන් තොර පරිසරයක් පවත්වාගෙන යන හොඳම පාසල්/පිරිවෙන් පහත ආකාරයට තෝරා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට හා අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් සෞඛ්‍ය හා පෝෂණ ශාඛාවට දැනුම් දීම.

- 1AB පාසල් 2
- 1C පාසල් 2
- 2 වර්ගයේ පාසල් 3
- 3 වර්ගයේ පාසල් 3
- පිරිවෙන් ආයතන 2

08. ගුරු විද්‍යාල හා අධ්‍යාපන විද්‍යා පීඨ අතරින් සෑම වර්ෂයක ම නොවැම්බර් 15 දිනට පෙර ඩෙංගු මදුරුවන්ගෙන් තොර පරිසරයක් පවත්වාගෙන යන හොඳම අධ්‍යාපන විද්‍යාපීඨ/ගුරු විද්‍යාල 3 තේරීම විද්‍යාපීඨ කොමසාරිස් විසින් සිදුකර අධ්‍යාපන ලේකම් වෙත වාර්තා කිරීම.

09. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාතේ සියලු ම අධ්‍යාපන ආයතන සැලකිල්ලට ගනිමින් ඩෙංගු මදුරුවන්ගෙන් තොර පරිසරයක් පවත්වාගෙන යන හොඳම අධ්‍යාපන කොට්ඨාස හා හොඳම අධ්‍යාපන කලාප 3 සහ තරක ම අන්දමින් පරිසරය පවත්වාගෙන යන අධ්‍යාපන කොට්ඨාස හා අධ්‍යාපන කලාප 3 තෝරා සෑම වර්ෂයක නොවැම්බර් 15 දිනට පෙර අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත වාර්තා කිරීම. මෙම තේරීමේ දී එම කොට්ඨාශයට හෝ කලාපයට අයත් පාසල් ,පිරිවෙන් ,කොට්ඨාස/කලාප කාර්යාල පරිශ්‍රය ආදී සියල්ල සැලකිල්ලට ගත යුතු ය.

10. සහතිකපත් ලබා දීම

(i) පාසල්/පිරිවෙන් අතරින් කලාප මට්ටමේ හොඳ ම පාසල්/පිරිවෙන් 3 සඳහා ද

(ii) විද්‍යාපීඨ/ගුරු විද්‍යාල අතරින් හොඳ ම විද්‍යාපීඨ/ගුරු විද්‍යාල 3 සඳහා ද

(iii) පළාතේ කොට්ඨාස හා කලාප අධ්‍යාපන කාර්යාල අතරින් හොඳ ම කොට්ඨාස හා කලාප අධ්‍යාපන කාර්යාල 3 සඳහා ද වර්ෂිකව සහතිකපත් පිරිනැමේ.

අධ්‍යාපන කලාපයේ සියලු ම පාසල් ඩෙංගු මදුරුවන්ගෙන් තොර පරිසරයක් පවතින බවට තහවුරු කර ගැනීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ වගකීම වේ.

පළාතේ සියලු ම පාසල් /අධ්‍යාපන ආයතන ඩෙංගු මදුරුවන්ගෙන් තොර පරිසරයක් පවතින බවට තහවුරු කර ගැනීම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ වගකීම වේ.

ඩෙංගු උවදුර මර්ධනය සඳහා සෑම පුද්ගලයකුගේම දායකත්වය අවශ්‍යවන බැවින් මෙම කාර්යය සඳහා විශේෂ අවධානය යොමුකර ක්‍රියා කිරීමට ද පාසල් හා අදාළ පාර්ශවයන් දැනුවත් කිරීමට ද නියාමනය පිළිබඳ විශේෂ අවධානය යොමුකර කටයුතු කරන ලෙස ද කාරුණික ව දන්වමි.

සුනිල් එස් සිරිසේන

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත - ලේකම් - සෞඛ්‍ය අමාත්‍යාංශය

ලේකම් - පළාත් පාලන අමාත්‍යාංශය

ලේකම් - පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය

අතිරේක ලේකම්වරුන් - අධ්‍යාපන අමාත්‍යාංශය

ප්‍රධාන කොමසාරිස් (විද්‍යාපීඨ/ගුරු විද්‍යාල) - අධ්‍යාපන අමාත්‍යාංශය

ආයතනයේ නම - .............................................

මාසය - ..............................

## පාසලේ මදුරුවන් බෝ වන ස්ථාන සොයා බැලීමේ වාර්තාපත

| | පරීක්ෂා කළ දිනය | හඳුනාගත් මදුරුවන් බෝ වන ස්ථාන | | | | | | ගත් ක්‍රියා මාර්ග | අත්සන /කමිටු ප්‍රධානී |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | | |
| පළමු සතිය | සඳුදා | | | | | | | | |
| | බදාදා | | | | | | | | |
| දෙවන සතිය | සඳුදා | | | | | | | | |
| | බදාදා | | | | | | | | |
| තුන්වන සතිය | සඳුදා | | | | | | | | |
| | බදාදා | | | | | | | | |
| හතරවන සතිය | සඳුදා | | | | | | | | |
| | බදාදා | | | | | | | | |
| | සඳුදා | | | | | | | | |
| | බදාදා | | | | | | | | |

## මදුරුවන් බෝ වන ස්ථාන

1. ඉවතලන පහසුවෙන් නොදිරන ද්‍රව්‍ය

- ප්ලාස්ටික් කෝප්ප
- ප්ලාස්ටික් දවටන
- පොලිතීන් කවර
- ඉටිරෙදි කැබලි
- ප්ලාස්ටික් බෝතල්
- රෙජිෆෝම්
- යෝගට් කෝප්ප

2. ඉවතලන පහසුවෙන් දිරාපත්වන ද්‍රව්‍ය

- දිවුල්/සියඹලා වැනි පළතුරුවල කටු/පොතු
- ගොලුබෙලි කටු

3. වැසි ජලය රැඳී තිබිය හැකි ස්ථාන

- අවහිරව ඇති සිමෙන්ති කාණු
- ජලය රැඳීමට හැකි කොන්ක්‍රීට් තල/වහල
- වැහි පීලි
- ප්‍රාථමික අංශයේ සෙල්ලම් මිදුලේ ඇති උපකරණ
- භාවිත නොකරන ලී බඩු ඇතුලු අබලි ද්‍රව්‍ය තබා ඇති ස්ථාන

4. විසිතුරු භාණ්ඩ හා උද්‍යාන අලංකරණ ද්‍රව්‍ය

- පොකුණු
- මාලු රහිත ටැංකි, මල් බඳුන්
- පන්ති කාමරවල තබා ඇති මල් බඳුන්

5. පාසල් භූමිය තුල ඇති ශාක හෝ ශාක කොටස්

- පත්‍ර අතර ජලය රැඳෙන විසිතුරු මල් පැළ
- හබරල වැනි ශාක වර්ග
- ගස් බෙන
- ජලය රැස්වන ශාක කඳන්

6. හඳුනාගත් වෙනත් ස්ථාන (සඳහන් කරන්න)

..............................................................................



# ඩෙංගු වළක්වා ගනිමු




ආයතනයේ නම :-

වගකීම භාර ගුරුභවතා/නිලධාරියාගේ නම :-

කමිටු සාමාජිකයන්ගේ නම් :-

කරමු පිරිසිදු නිතිපතා - මදුරු බෝවන තැන් නසා

අපේ ජීවිත අපිම සුරකිමු - ඩෙංගු උවදුර දුරැරලා

ඇමුණුම 2

25

ආයතනයේ නම - ......................................................

අධ්‍යාපන කොට්ඨාසය - ..............................................

පාසලේ නම - ..................................

මාසය - ......................................

පාසල් /ආයතන පරිසරයේ මදුරුවන් බෝ වන ස්ථාන පිළිබඳ සොයා බැලීමේ මාසික වාර්තාව

| පරීක්ෂා කළ ස්ථාන | මදුරුවන් බෝ වන ස්ථාන | | ගත්තාලද ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| | ඇත | නැත | |
| 1. ඉවතලන පහසුවෙන් නොදිරන ද්‍රව්‍ය | | | |
| ➢ ප්ලාස්ටික් කෝප්ප | | | |
| ➢ ප්ලාස්ටික් දවටන | | | |
| ➢ පොලිතීන් කවර | | | |
| ➢ ඉටිරෙදි කැබලි | | | |
| ➢ ප්ලාස්ටික් බෝතල් | | | |
| ➢ රෙජිෆෝම් | | | |
| ➢ යෝගට් කෝප්ප | | | |
| 2.ඉවතලන පහසුවෙන් දිරාපත්වන ද්‍රව්‍ය | | | |
| ➢ දිවුල්/සියඹලා වැනි පලතුරුවල කටු/පොතු | | | |
| ➢ ගොලුබෙලි කටු | | | |
| 3. වැසි ජලය රැදී තිබිය හැකි ස්ථාන | | | |
| ➢ අවහිරව ඇති සිමෙන්ති කාණු | | | |
| ➢ ජලය රැදීමට හැකි කොන්ක්‍රීට් තල/වහල | | | |
| ➢ වැහි පීලි | | | |
| ➢ ප්‍රාථමික අංශයේ සෙල්ලම් මිදුලේ ඇති උපකරණ | | | |
| 4. විසිතුරු භාණ්ඩ හා උද්‍යාන අලංකරණ ද්‍රව්‍ය | | | |
| ➢ පොකුණු | | | |
| ➢ මාලු රහිත ටැංකි, මල් බඳුන් | | | |
| ➢ පන්ති කාමරවල තබා ඇති මල් බඳුන් | | | |
| 5. පාසල් භූමිය තුළ ඇති ශාක හෝ ශාක කොටස් | | | |
| ➢ පත්‍ර අතර ජලය රැඳෙන විසිතුරු මල් පැල | | | |
| ➢ හබරල වැනි ශාක වර්ග | | | |
| ➢ ගස් බෙන | | | |
| ➢ ජලය රැස්වන ශාක කඳන් | | | |
| 6. හඳුනාගත් වෙනත් ස්ථාන (සඳහන් කරන්න) | | | |

පාසල්/ආයතන පරිසරයේ මදුරුවන් බෝ වීමට හැකියාව ඇති ස්ථාන පිළිබඳ පරීක්ෂා කරන ලදී. ඒ අනුව

1. මදුරුවන් බෝ වන ස්ථාන හමුවූ අතර ඒ සඳහා පිළියම් යොදන ලදී ☐

2. මදුරුවන් බෝ වන ස්ථාන හමු නොවිය ☐

පාසල/ආයතනය මදුරුවන් බෝ වන ස්ථානවලින් තොර බව තහවුරු කරමි.

.......................................... ............

ආයතන ප්‍රධානියාගේ (අත්සන) දිනය